2036 (1014) (31)

"අභිමානවත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්"
"அபிமானமிக்க மக்கள்,சுபீட்சமான மாகாணம்"
"A PROUD NATION, A PROSPEROUS PROVINCE"

# ආණ්ඩුකාරවර කාර්යාලය - උතුරු මැද පළාත
# ஆளுநர் அலுவலகம் - வட மத்திய மாகாணம்
# GOVERNOR'S OFFICE - NORTH CENTRAL PROVINCE


මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර.
மைத்திரிபால சேனாநாயக்க மாவத்தை, அனுராதபுரம்.
MAITHRIPALA SENANAYAKA MAWATHA, ANURADHAPURA
Web site : www.governor.nc.gov.lk E-mail : govsecncp@gmail.com


ඔබේ අංකය / உமது இல / Your No

මගේ අංකය / எனது இல / My No: NCP/GOV/5/8/(ii)(2023)

දිනය / திகதி / Date: 2023.10. 06

07 OCT 2023

FD.

ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

**<u>පළාත් සභා ශ්‍රවණාගාරයේ ගාස්තු සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණට අදාළව මා වෙත යොමු කරන ලද ඔබේ අංක: NCP/CS/FD/01/06/2023 හා 2023.10.03 දිනැති ලිපිය හා බැඳේ.

02) ඒ අනුව ඉහත ලිපිය මඟින් කර ඇති ඔබගේ නිර්දේශය , ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(සුජන්ත ඒකනායක)
ආණ්ඩුකාර ලේකම්,
ආණ්ඩුකාර කාර්යාලය,
උතුරු මැද පළාත.


ගරු ආණ්ඩුකාරවර / கௌரவ ஆளுநர் / Hon.Govener — දුරකථන/தொலைபேசி/Tel : 025 2222403; ෆැක්ස්/பெக்ஸ்/Fax : 025 2224090
තොරතුරු දැනගැනීමේ නිලධාරී / தகவல் உத்தியோகத்தர் / Information Officer — දුරකථන/தொலைபேசி/Tel : 025 2235067; ෆැක්ස්/பெக்ஸ்/Fax : 025 2235067
ආණ්ඩුකාරවර ලේකම් / ஆளுநர் செயலாளர் — දුරකථන/தொலைபேசி/Tel : 025 2235067; ෆැක්ස්/பெக்ஸ்/Fax : 025 2235067
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන/தொலைபேசி/Tel : 025 2235067; ෆැක්ස්/பெக்ஸ்/Fax : 025 2235067

NCP/CS/FD/01/06/2023

2023.10.07

ලේකම්,

ආණ්ඩුකාරවර කාර්යාලය,

උතුරු මැද පළාත.

<u>පළාත් සභා ශ්‍රවණාගාරයේ ගාස්තු සංශෝධනය කිරීම</u>

උතුරු මැද පළාත් සභා සංකීර්ණයේ ඇති ශ්‍රවණාගාරය බාහිර පාර්ශවයන් වෙත ලබා දීමේ දී, මේ වන විට දිනකට රු.35,000/-ක ගාස්තුවක් අය කරනු ලැබේ. එහෙත් පසුගිය වර්ෂ කීපය තුල අඛණ්ඩව ඉහල ගිය විදුලි ගාස්තු, ජල ගාස්තු, පවිත්‍රතා වියදම්, ගොඩනැගිලි නඩත්තු වියදම් හා වායු සමීකරණ ඇතුළු අනෙකුත් ශ්‍රවණාගාර උපකරණ නඩත්තු වියදම් ආවරණය කර ගැනීම සඳහා මෙම මුදල කිසි සේත් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කරමි.

02. ඒ අනුව ශ්‍රවණාගාරයේ ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධව යෝජනා ලබා ගැනීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව මගින් ඉදිරිපත් කරන ලද පහත නිර්දේශයන් (ඇමුණුම 01) සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින්ද නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 02)

03. මෙම කරුණු සැලකිල්ලට ගෙන උතුරු මැද පළාත් සභා සංකීර්ණයේ ඇති ශ්‍රවණාගාරය බාහිර පාර්ශවයන් වෙත ලබා දීමේ දී පහත පරිදි ගාස්තු අයකිරීම නිර්දේශ කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

a) පුද්ගලික පාර්ශවයන් වෙත ශ්‍රවණාගාරය ලබා දීමේ දී ගාස්තු අයකිරීම

I. වායු සමීකරණ පහසුකම් සහිතව, සතියේ දිනක් සඳහා රු.75,000.00 ක හා සති අන්ත දිනක් සඳහා රු. 100,000.00ක ගාස්තුවක් අය කිරීම (පැය 06 ක කාල සීමාවක් සඳහා)

II. ශ්‍රවණාගාරය වෙන් කරවා ගැනීමේදී අදාළ ගාස්තුවෙන් 50% ක අත්තිකාරම් මුදලක් පූර්වයෙන් ලබා ගැනීම

III. අත්තිකාරම ගෙවූ පසු වැඩසටහන අවලංගු කළහොත් අත්තිකාරමෙන් 50% ක් ආපසු නොගෙවා තබා ගැනීම

IV. ශ්‍රවණාගාරය වෙන් කරවා ගැනීමේදී රු. 40,000.00 ඇප තැන්පත් මුදලක් ලබා ගැනීම හා වැඩසටහන අවසන් වූ පසු, ශ්‍රවණාගාරයට සිදු වී ඇති අලාභ අයකර ඉතිරිය ආපසු ගෙවීම

V. ශ්‍රවණාගාරය අවශ්‍ය දිනට සතියකට පෙර සම්පූර්ණ ගාස්තුව හා තැන්පතුව ලබා ගැනීම

VI. පෙර පුහුණුවීම් සඳහා ශ්‍රවණාගාරය ලබා ගන්නේ නම් වායු සමීකරණ රහිතව පැයකට රු.7,500/-ක් බැගින් ගාස්තුවක් අය කිරීම

b) පුද්ගලික නොවන පාර්ශවයන් (රජයේ ආයතන) වෙත ලබා දීමේ දී පහත පරිදි ගාස්තු අයකිරීම

| ආයතනය | සතියේ දින සඳහා අය කිරීමට නිර්දේශ කරන ගාස්තුව (රු.) | සති අන්ත දින සඳහා අය කිරීමට නිර්දේශ කරන ගාස්තුව (රු.) |
|---|---|---|
| පළාත් සභාවේ ආයතන (ගාස්තු අය කිරීමක් නැත) | නැත | නැත |
| මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු , අමාත්‍යාංශ හා ආයතන (ගාස්තුවෙන් ½) | 37,500.00 | 50,000.00 |
| අර්ධ රාජ්‍ය ආයතන (ගාස්තුවෙන් ¾) | 60,000.00 | 75,000.00 |

C) දිස්ත්‍රික් සංවර්ධන කමිටු වැනි පළාත් සභාව එක්ව කරන කටයුතු වලදීද එම කටයුතු පළාත් සභාවේ කටයුතු සේ සලකා ගාස්තුවෙන් නිදහස් කිරීම.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර,

ප්‍රධාන ලේකම්,

උතුරු මැද පළාත.